# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2182/3 - 2020 ජුනි මස 29 වැනි සඳුදා - 2020.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: KDS/PJP/04/04/2/W/83.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2015/WS/144.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 547 දිද්දෙනිය හා අංක 513 මැදගොඩ යන ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට අයත් දිද්දෙනිය සහ මැදගොඩ යන ගම්වල පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කර අනුමත කරන ලද, 2020.02.24 වැනි දිනැති අංක මහ 6975 දරන මූලික පිඹුරේ, කැබලි අංක 1, 2, 3 හා 4 වශයෙන් දැක්වෙන, ගිනිගේවත්ත හේන හෙවත් එක්කස්සවත්ත හා පිහිඹියගහමුලහේන නමැති ඉඩම් වලින්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1849 (රූඩ් 01 පර්චස් 33.1)ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් හතර:

කැබලි අංක 1

ඉඩමේ නම: ගිනිගේවත්ත හේන හෙවත් එක්කස්ස වත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: එරන්ද විජේරත්න මහතා, අංක 8/1, අංකුඹුර පාර, දිද්දෙනිය, පූජාපිටිය; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0038 (පර්චස් 1.5)

**ඉඩමේ මායිම් :**

*උතුරට* : මාර්ගය සහ මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය); *නැගෙනහිරට* : එරන්ද විජේරත්න හිමිකම් කියන ගිනිගේවත්ත හේන හෙවත් එක්කස්ස වත්ත; *දකුණට* : එරන්ද විජේරත්න හිමිකම් කියන ගිනිගේවත්ත හේන හෙවත් එක්කස්ස වත්ත සහ මාර්ගය; *බටහිරට*: මාර්ගය.

කැබලි අංක 2

ඉඩමේ නම: ගිනිගේවත්ත හේන හෙවත් එක්කස්ස වත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: බී. එම්. එස්. බණ්ඩාරනායක මහතා, අංක 06, පැපිලියාන පාර, ගංගොඩවිල, නුගේගොඩ; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.1281 (රූඩ් 01 පර්චස් 10.6)

**ඉඩමේ මායිම් :**

*උතුරට* : සංඛ මුතුබණ්ඩා සහ තවත් අය හිමිකම් කියන එක්කස්ස වත්ත සහ මාර්ගය; *නැගෙනහිරට*: මාර්ගය සහ මල්ලිකා කුමාරිහාමි හිමිකම් කියන එක්කස්ස වත්ත; *දකුණට*: මල්ලිකා කුමාරිහාමි හිමිකම්

1A - G 32402 - 31 (2020/07)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

කියන එක්කස්ස වත්ත, කැබලි අංක 3 සහ කැබලි අංක 4; *බටහිරට*: කැබලි අංක 4 සහ සංඛ මුතුබණ්ඩා සහ තවත් අය හිමිකම් කියන එක්කස්ස වත්ත.

**කැබලි අංක 3**

ඉඩමේ නම: ගිනිගේවත්ත හේන හෙවත් එක්කස්ස වත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ඩබ්. එම්. නිශ්ශංක බණ්ඩාර මහතා, අංක 8ඒ, එක්කස්ස වත්ත, දිද්දෙනිය, පූජාපිටිය; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0073 (පර්චස් 2.9)

**ඉඩමේ මායිම් :**

*උතුරට* : කැබලි අංක 2 සහ මල්ලිකා කුමාරිහාමි හිමිකම් කියන එක්කස්ස වත්ත; *නැගෙනහිරට*: මල්ලිකා කුමාරිහාමි හිමිකම් කියන එක්කස්ස වත්ත; *දකුණට*: මල්ලිකා කුමාරිහාමි හිමිකම් කියන එක්කස්ස වත්ත , සුනිල් කීර්තිරත්න හිමිකම් කියන පිහිඹියගහමුල හේන සහ කැබලි අංක 4; *බටහිරට*: කැබලි අංක 4 සහ කැබලි අංක 2.

**කැබලි අංක 4**

ඉඩමේ නම: පිහිඹියගහමුල හේන; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: ඩී. එම්. ගාමිණී අබේරත්න මහතා, අංක 116/B, මැදගොඩ, පූජාපිටිය; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0457 (පර්චස් 18.1)

**ඉඩමේ මායිම් :**

*උතුරට* : සංඛ මුතුබණ්ඩා සහ තවත් අය හිමිකම් කියන එක්කස්ස වත්ත, කැබලි අංක 2 සහ කැබලි අංක 3; *නැගෙනහිරට*: කැබලි අංක 3, මල්ලිකා කුමාරිහාමි හිමිකම් කියන එක්කස්ස වත්ත, සුනිල් කීර්තිරත්න හිමිකම් කියන පිහිඹියගහමුල හේන සහ ඩී. එම්. පී. අබේරත්න හිමිකම් කියන පිහිඹියගහමුල හේන; *දකුණට* : ඩී. එම්. පී. අබේරත්න හිමිකම් කියන පිහිඹියගහමුලහේන සහ මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය); *බටහිරට*: මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය) හා සංඛ මුතුබණ්ඩා සහ තවත් අය හිමිකම් කියන එක්කස්ස වත්ත.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 අගෝස්තු මස 12 වැනි දින පෙ. ව. 10.00 ට පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2020 අගෝස්තු මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා එම වන්දි මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

එම්. ඩබ්. එම්. එම්. මඩහපොල,
ප්‍රාදේශීය ලේකම්,
පූජාපිටිය.

2020 ජූනි මස 24 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පූජාපිටිය.

07-370

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු යොමු අංකය*: KDS/PJP/04/04/2/W/84.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2015/WS/121.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 513 දරන මැදගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දිද්දෙනිය සහ මැදගොඩ යන ගම්වල පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කර අනුමත කරන ලද, 2020.05.26 වන දිනැති අංක මහ 6989 දරන මූලික පිඹුරේ, කැබලි අංක 1 වශයෙන් දැක්වෙන, එක්කස්සවත්ත නමැති ඉඩමෙන්, පූළු ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.0066 (පර්චස් 2.61) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස සහ අංක 547 දිද්දෙනිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දිද්දෙනිය සහ මැදගොඩ යන ගම්වල පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කර අනුමත කරන ලද, 2020.05.26 වැනි දිනැති අංක මහ 7014 දරන මූලික පිඹුරේ, කැබලි අංක 1 වශයෙන් දැක්වෙන, එක්කස්සවත්ත හෙවත් ගිනිගේවත්ත නමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0136 (පර්චස් 5.4)ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස ද ඇතුළත් ඉඩම් කොටස් දෙක:

1. **මූලික පිඹුරු අංකය මහ 6989**

**කැබලි අංක 1**

ඉඩමේ නම: එක්කස්සවත්ත; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්: 1. කේ. එම්. ඩබ්ලිව්. සංඛ මුතුබණ්ඩාර මහතා, අංක 76, මැදගොඩ, පූජාපිටිය 2. එස්. බණ්ඩාරනායක මහතා, අංක 06, පැපිලියාන පාර, ගංගොඩවිල, නුගේගොඩ; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0066 (පර්චස් 2.61)

**ඉඩමේ මායිම් :**

*උතුරට* : සංඛ මුතුබණ්ඩාර සහ තවත් අය හිමිකම් කියන එක්කස්සවත්ත, මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය) සහ එරන්ද විජේරත්න හිමිකම් කියන ගිනිගේවත්ත හේන හෙවත් එක්කස්සවත්ත; *නැගෙනහිරට* : එරන්ද විජේරත්න හිමිකම් කියන ගිනිගේවත්ත හේන හෙවත් එක්කස්සවත්ත, මූලික පිඹුරු අංක මහ 6975 හි කැබලි අංක 1 සහ මූලික පිඹුරු අංක මහ 7014 හි කැබලි අංක 1; *දකුණට* : මූලික පිඹුරු අංක මහ 7014 හි කැබලි අංක 1, මූලික පිඹුරු අංක මහ 6975හි කැබලි අංක 2 සහ සංඛ මුතුබණ්ඩාර සහ තවත් අය හිමිකම් කියන එක්කස්සවත්ත; *බටහිරට* : සංඛ මුතුබණ්ඩාර සහ තවත් අය හිමිකම් කියන එක්කස්සවත්ත, මාර්ගය (පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය).

**2. මූලික පිඹුරු අංකය මහ 7014**

**කැබලි අංක 1**

ඉඩමේ නම: එක්කස්ස වත්ත හෙවත් ගිනිගේවත්ත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: එස්. බණ්ඩාරනායක මහතා, අංක 06, පැපිලියාන පාර, ගංගොඩවිල, නුගේගොඩ; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0136 (පර්චස් 5.4)

**ඉඩමේ මායිම් :**

*උතුරට* : මූලික පිඹුරු අංක මහ 6989හි කැබලි අංක 1 සහ මූලික පිඹුරු අංක මහ 6975හි කැබලි අංක 1; *නැගෙනහිරට* : මූලික පිඹුරු අංක මහ 6975හි කැබලි අංක 1 සහ එරන්ද විජේරත්න හිමිකම් කියන ගිනිගේවත්තහේන *හෙවත් එක්කස්සවත්ත*; *දකුණට* : එරන්ද විජේරත්න හිමිකම් කියන ගිනිගේවත්තහේන *හෙවත් එක්කස්සවත්ත* සහ මල්ලිකා කුමාරිහාමි හිමිකම් කියන එක්කස්සවත්ත ; *බටහිරට* : මල්ලිකා කුමාරිහාමි හිමිකම් කියන එක්කසවත්ත සහ මූලික පිඹුරු අංක මහ 6975හි කැබලි අංක 2

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 අගෝස්තු මස 12 වැනි දින ප. ව. 1.00 ට පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2020 අගෝස්තු මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන්, ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා එම වන්දි මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

එම්. ඩබ්. එම්. එම්. මඩහපොල,
ප්‍රාදේශීය ලේකම්,
පූජාපිටිය.

2020 ජූනි මස 24 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පූජාපිටිය.

07-371